# මැතිවරණ කොමිෂන් සභාව

## තනතුරු පුරප්පාඩු

මැතිවරණ කොමිෂන් සභාවේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල පහත දක්වා ඇති පරිදි පුරප්පාඩු වී පවතින කාර්යාල සේවක සේවයේ තනතුරු සඳහා දැනට මධ්‍යම රජයේ සේවයේ නියුතු කාර්යාල සේවක සේවකයින් ස්ථිරව ස්ථාන මාරු කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

| අනු අංකය | කාර්යාලය | කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 01. | කොළඹ දිස්ත්‍රික් | 02 |
| 02. | කොළඹ නාගරික | 02 |
| 03. | ගම්පහ | 02 |
| 04. | මාතර | 01 |
| 05. | මහනුවර | 03 |
| 06. | නුවරඑළිය | 02 |
| 07. | මාතලේ | 01 |
| 08. | බදුල්ල | 02 |
| 09. | රත්නපුර | 02 |
| 10. | කෑගල්ල | 01 |
| 11. | පුත්තලම | 02 |
| 12. | මොණරාගල | 01 |
| 13. | අනුරාධපුර | 01 |
| 14. | පොළොන්නරුව | 01 |
| 15. | ත්‍රිකුණාමලය | 01 |
| 16. | වවුනියාව | 02 |

**පොදු කොන්දේසි,**

I. මධ්‍යම රජයේ සේවයේ නියුතු කාර්යාල සේවක සේවයේ තනතුරේ වර්තමානයේ සේවය කරන සේවකයෙකු විය යුතු ය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීමට අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

III. රාජ්‍ය සේවය තුළ මනා පැවැත්මකින් යුතුව සේවයේ යෙදෙන සේවකයෙකු විය යුතු ය.

IV. ආයතන සංග්‍රහයේ XXXII පරිච්ඡේදයේ 1.1 අනුව මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් හට දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකමක් නොමැත.

V. අයදුම්කරුගේ පවුලේ සාමාජිකයෙකු හෝ කලත්‍රයාගේ පවුලේ සාමාජිකයෙකු ක්‍රියාකාරී දේශපාලන කටයුතු වල යෙදී නොමැති/ නොයෙදෙන තැනැත්තෙකු විය යුතු ය.

VI. මැතිවරණයක් පවතින කාල සීමාව තුළ සාමාන්‍ය රාජකාරී වේලාවට පරිබාහිරව සති අන්ත සහ රජයේ නිවාඩු දිනවලද රාජකාරි ඉටු කිරීම කළ යුතු ය.

<u>අමතර දීමනා.</u>

මැතිවරණ කොමිෂන් සභාවට ස්ථාන මාරුවීම් ලද හොත් සේවකයාගේ මූලික වැටුපෙන් 25%ක අමතර දීමනාවක් මාසිකව ගෙවීමට ක්‍රියා කරනු ලැබේ.

(අ.පි.බ. ⟶ )

ඉල්ලුම් කල යුතු ආකාරය

ඒ අනුව ස්ථාන මාරුවීම් ලබා පැමිණීමට කැමති කාර්යාල සේවක සේවකයින් ඒ සඳහා තමන් විසින් සකස් කරගන්නා ලද ඉල්ලීම් ලිපියක් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව **මැතිවරණ කොමසාරිස් ජනරාල්, මැතිවරණ මහලේකම් කාර්යාලය, සරණ මාවත, රාජගිරිය,** යන ලිපිනයට විය යුතු ය. එලෙස ලැබෙන ඉල්ලීම් හා පෞද්ගලික ලිපි ගොනුව අනුව අදාල සේවකයන් මැතිවරණ කොමිෂන් සභාවේ සේවය සඳහා යෝග්‍ය වන්නේ ද යන්න පරීක්ෂා කර බැලීමෙන් පසු, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ස්ථාන මාරු කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

සටහන

අනුප්‍රාප්තිකයෙකු රහිතව හෝ පසුව ලබා ගැනීමේ පදනම මත ඉදිරිපත් වන ස්ථාන මාරු ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කරනු ලැබේ.

**මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,**

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්

2025 මාර්තු මස 05 දින
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.